වඩමාරච්චි නිරිත ප්‍රාදේශිය සභාව

යාපනය දිස්ත්‍රික්කය

---------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම.

---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 20 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2012 අප්‍රේල් 04 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 13 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කර ඇත.

1.2 මතය

-------

මාගේ පරික්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව වඩමාරච්චි නිරිත ප්‍රාදේශිය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශ වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට වඩමාරච්චි නිරිත ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්විම්

-------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

(අ) වගකීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන්හි නිරික්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශයන්හි කෙරෙහි බලපෑම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම |
|---|---|---|
| වැඩියෙන් දැක්වීම් | 03 | 22,391,881 |
| අත්හැරීම් | 01 | 769,608 |

(ආ) රජයෙන් සහ රාජ්‍ය නොවන සංවිධාන වලින් සමාලෝචිත වර්ෂයේදි පරිත්‍යාග වශයෙන් ලැබුණු වාහන 08 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශයන්හි අනාවරණය කර නොතිබුණි.

| වාහන වර්ගය | වාහන අංකය |
|---|---|
| ට්‍රැක්ටර් | WPGJ 2730 |
| ට්‍රැක්ටර් | EPRA 2808 |
| ට්‍රැක්ටර් | - |
| ට්‍රැක්ටර් ටේලර් | WPRB 8275 |
| ට්‍රැක්ටර් ටේලර් | EPRA 1592 |
| පික්අප් | 252-6561 |
| එම්ටි බවුසර් | - |
| වතුර බවුසර් | - |

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති විම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු.35,546,745 ක් වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සත්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය රු.27,675 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.22,528,336 ක් විය.

2.2 මූල්‍ය පාලනය

-----------------

අයවැය ඇස්තමේන්තු නිසි පරිදි පිළියෙල කර නොතිබුණි. එබැවින් අයවැයගත ආදායම් සහ තථ්‍ය ආදායම් අතර රු.7,276,990 ක් වූ වෙනසක් ද අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර රු.4,859,401 ක වෙනසක් ද විගණනයේදී නිරීක්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

-------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

---------------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දින සමුච්චිත හිඟ |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 643 | 125 | 1,859 |
| බදු කුලි | 9,900 | 12,237 | 130 |
| බලපත්‍ර ගාස්තු | 845 | 978 | - |
| වෙනත් ආදායම් | 39,083 | 44,408 | 27,771 |

2.3.2 ආදායම් කළමනාකරණය

---------------------------------

එකතුව රු.1,989,606 ක් වූ හිඟ තක්සේරු බදු, වෙළඳ පොළ කුලී සහ බදු කුලී අයකර ගැනීම සඳහා සභාව විසින් අර්ථවත් සහ නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.3.3 ආදායම් අහිමි වීම

--------------------------

විදුලිබලයට අදාල සියළුම කටයුතු 1999 වර්ෂයේ සිට ලංකා විදුලිබල මණ්ඩලයට භාරදී තිබුණු නමුත් ලංකා විදුලිබල මණ්ඩලය සමග ගිවිසුමකට එළඹී නොතිබුණු බැවින් සභා බල ප්‍රදේශය තුල වීථි ලාම්පු සවිකිරීම සභා අරමුදලින් සිදුකර තිබුණි. එබැවින් ප්‍රතිපූර්ණ නොලැබීම හේතුකොට ගෙන සභාවට රු.500,800 ක පාඩුවක් විදීමට සිදු වී තිබුණි.

2.3.4 උසාවි දඩ

-----------

(අ) 2011 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා විවිධ ආඥා පණත් යටතේ පනවන ලද උසාවි දඩ සහ දණ්ඩන වෙනුවෙන් මහේස්ත්‍රාත් අධිකරණයන්ගෙන් ලැබිය යුතු රු.371,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) විවිධ ආඥා පණත් යටතේ 2010, 2011 සහ 2012 යන වර්ෂයන් සඳහා පිළිවෙලින් රු.1,259,250 ක් , රු.814,125 ක් සහ රු.3,984,500 ක් වූ උසාවි දඩ සහ දණ්ඩන අයකර ගැනීම සඳහා සභාව විසින් පියවර ගෙන නොතිබුණි.

2.3.5 මුද්දර ගාස්තු

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006, 2011 සහ 2012 ජූලි සිට දෙසැම්බර් දක්වා කාලය සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයවිය යුතු පිළිවෙලින් රු.14,722,337 ක් , රු.17,878,713 ක් සහ රු.11,319,972 ක් වූ මුද්දර ගාස්තු ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) 2010-2012 කාලපරිච්ඡේදය සඳහා ලැබිය යුතු වූ රු.21,712,748 ක් වූ මුද්දර ගාස්තු ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබී නොතිබුණ අතර, ඉහත සඳහන් මුදල් අයකර ගැනීම සඳහා සභාව විසින් අර්ථවත් පියවර ගෙන නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

-----------------------------

2.4.1 නිෂ්ක්‍රීය සහ ඌන උපයෝජිත භෞතික සම්පත්

-----------------------------------------------------

භෞතික සම්පත් විෂයයන් හතරක් පසුගිය වර්ෂ 04 තුල සභාව විසින් උපයෝජනය කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

(I) යතුරුපැදි

(ii) රෝද දෙකේ ට්‍රැක්ටරය

(iii) රෝද දෙකේ ට්‍රැක්ටර පෙට්ටිය

(iv) පික්අප් රථය

2.4.2 අයවිය යුතු කාර්ය මණ්ඩල ණය

-------------------------------------

තනතුරු අතහැර ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු එකතුව රු.46,000 ක් වූ කාර්ය මණ්ඩල ණය ශේෂයන් වර්ෂ 5 කට අධික කාලයක් අයනොවී පැවතුණි. මෙම ශේෂයන් ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4.3 සමීක්ෂණය නොකළ වත්කම්

----------------------------------

වත්කම් 2012 දෙසැම්බර් 31 දිනට වූ සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් සනාථ නොකොට පොත් අගය මත රු.38,133,514 ක් ලෙස ගිණුම් ගතකර තිබුණි. විස්තර පහත දැක්වේ.

| වත්කම | මුදල |
|---|---|
| | රු. |
| ස්ථාවර වත්කම් | 37,588,378 |
| ගබඩා විෂයයන් | 545,136 |
| | --------------- |
| | 38,133,514 |
| | ========== |

2.5 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

-----------------------------------------------------

පහත සඳහන් නීති, රිති.රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම් විගණනයේදි නිරික්ෂනය විය.

| නීති, රිති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව. | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) ප්‍රාදේශිය සභා ( මූල්‍ය සහ පරිපාලන) රීති - 1988 | | |
| (i) III පරිච්ඡේදයේ 33 වගන්තිය | - | තක්සේරු ලිපිකරු විසින් සෑම කාර්තුවකදිම තක්සේරු බදු පැහැර හැරි පුද්ගලයින්ගේ ලැයිස්තුවක් පිළියෙල කර සභාපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) III පරිච්ඡේදයේ 76 වගන්තිය | - | ඉඩම් සහ පරිශ්‍රයන්හි කුලී හෝ බදුකුලී රු.130,276 ක් ගෙවීම ප්‍රමාදවීම් සම්බන්ධව ආදායම් ලිපිකරු විසින් ලේකම්වරයාට හෝ සභාපතිවරයාට වාර්තා කර නොතිබුණි. |
| (iii) III පරිච්ඡේදයේ 81 වගන්තිය | - | ඉඩම් ගනුදෙනු සම්බන්ධ මුද්දර ගාස්තු සහ දඩමුදල් ආපසු ගෙවීම සම්බන්ධයෙන් සෑම කාර්තුවක් අවසානයේදිම කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) මු.රෙ. 234 | - | මාස 06 කට අධික කාලයක් උපලබ්ධි |

නොවී පැවති රු.10,500 ක් වූ චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පසු විපරම් කටයුතු කර නොතිබුණු අතර එය විවිධ තැන්පතු ගිණුමෙහි ඇතුලත් කර තිබුණි.

(ii) මු.රෙ. 571 - වර්ෂ 02 කට වැඩි රු.80,548 ක් වූ විවිධ තැන්පතු ආදායම් ගිණුමට මාරු කිරිම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඇ) උතුරු පළාත් මුදල් රීති අංක 101 සහ 102 - සභාව විසින් සෑම කාර්තුවක් අවසානයේදි අභ්‍යන්තර විගණන වැඩසටහන් සහ අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

2.6 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

සභාවේ දෛනික වැඩකටයුතු ආයතන සංග්‍රහයේ vii පරිච්ඡෙදයේ 3.2 වගන්තිය ප්‍රකාරව නිසි පරිදි සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණු අතර දෛනික වැඩකටයුතු වලට අදාල අවසන් ගිණුම් පිළියෙල කිරිම සඳහා අතිකාල සහ නිවාඩු දින වැටුප් වශයෙන් රු.27,375 ක් සභාව විසින් ගෙවා තිබුණි.

2.7 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

(අ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ ප්‍රමාදයන්

--------------------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i.) මාන්ඩාන් කසළ අපහරණ ඉඩමේ තාප්පය ඉදිකිරිම සඳහා 2011 වර්ෂයේදි වෙන් කරන ලද රු.284,648 ක් වූ අරමුදල් එම විශේෂිත කාර්යය සඳහා යොදා නොගෙන වෙනත් ව්‍යාපෘති සඳහා යොදාගෙන තිබුණි.

(ii.) ප්‍රාග්ධන වැඩ 17 ක් සඳහා රු.8,441,147 ක් වූ අරමුදල් අයවැය ලේඛනයෙන් වෙන්කර තිබුණ ද එම වැඩ සමාලෝචිත වර්ෂය තුල නිමකර නොතිබුණි. කෙසේ වුවද ප්‍රාග්ධන වැඩ ක්‍රියාත්මක කිරිමේ ප්‍රමාදය

හේතුවෙන් ඉදිරියේදි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම පිණිස ඉහත සඳහන් මුදල් විවිධ ණයහිමියන් යටතේ දක්වා තිබුණි.

(ආ) අත්හැර දමන ලද ව්‍යාපෘති

--------------------------------

වටිනාකම රු.1,800,000 ක් වු ශ්‍රී මුරුගන් කෝවිල මාර්ගය පුනරුත්ථාපන ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය තුලදි ක්‍රියාත්මක කර නොතිබුණි.

2.8 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 සහ 2011 වර්ෂයන්හිදි කොන්ත්‍රාත්කරුවන්ට කරන ලද ගෙවිම් වලින් රඳවාගෙන තිබු රු.381,895 ක මුදලක් කොන්ත්‍රාත්කරුවන්ට නොගෙවා විවිධ තැන්පතු ගිණුමෙහි රඳවා ගෙන තිබුණි.

(ආ) 2007 වර්ෂයේ සිට ප්‍රජා මධ්‍යස්ථානය සඳහා විවිධ ණය හිමියන් යටතේ ප්‍රතිපාදනය කර තිබුණු රු.65,000 ක් මෙම වාර්තාවේ දිනය දක්වා අදාළ ප්‍රජා මධ්‍යස්ථානය වෙත පරිත්‍යාග ලෙස ගෙවා නොතිබුණි.

(ඇ) 2011 සහ 2012 වර්ෂය සඳහා විවිධ ණය හිමියන් යටතේ ප්‍රතිපාදිත රු.134,262 ක් අදාල පුද්ගලයන් වෙත ගෙවා නොතිබුණි.

2.9 අභ්‍යන්තර විගණනය

--------------------------

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති සහ පාලන

----------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ආදායම් රැස්කිරිම

(ආ) ස්ථාවර වත්කම්

(ඇ) ගිණුම්කරණය

(ඇ) පරිත්‍යාග

(ඉ) විවිධ තැන්පතු